# ලංකා ලේලන්ඩ් ලිමිටඩ්

## 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## වාර්ෂික වාර්තාව

**අධ්‍යක්ෂක වරුන්ගේ වාර්තාව**

2012 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව ඔබ වෙත පිළිගන්වන්නෙමු.

**ආයතනයේ ක්‍රියාකාරකම්**

ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ, අප විසින් විශාල ආයෝජනයක් කර ඇති ලංකා අශෝක් ලේලන්ඩ් PLC සමාගමේ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීමය.

**වසරේ විශ්ලේෂණය**

2012 මාර්තු 31 අවසන් වර්ෂය සඳහා

| | |
|---|---|
| ආදායම | 46,758,143 |
| බදු පෙරලාභය | 45,091,305 |
| ආදායම් බදු | (1,185,747) |
| බදු පසු වර්ෂයේ ලාභය | 43,905,557 |

**අධ්‍යක්ෂ මණ්ඩලය**

එස්. ලියාඋඩීන්

බී.එම්. රියාජ්

එස්. ආනන්දරාසා

එම්.එස්. අන්වර්ඩීන්

කේ.එම්. රිෂ්වි

ලාභාංශ

වර්ෂය සඳහා ලාභාංශ වශයෙන් රු. 39,031,370.01 ගෙවා ඇත.

**සමාගම සමග අධ්‍යක්ෂ මණ්ඩලය ඇතිකරගත්තා වූ ගිවිසුම්**

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 16 හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම සමග ඇති කරගත්තාවූ ගිවිසුම් දක්වා ඇත.

විගණකවරු

එම්/එස් ක්‍රෙස්ටන් එම්.එන්.එස්. සහ සමාගම විසින් ගිණුම් විගණනය කරන ලදී. ඔවුන් ඊලග වර්ෂය සඳහා පත්වීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අන පරිදි

අත්සන් කලා

සභාපති

23/11/2012

ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගමෙහි කොටස් හිමියන් වෙත ස්වාධීන විගණකගේ වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව

ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රකාශන, එනම් 2012 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය,ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා පිටු අංක 08 සිට 16 දක්වා අන්තර්ගත වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක්ද වෙනත් පැහැදිලි කිරීම් වලින් සමන් විත සටහන් ද අප විසින් විගණනය කරන ලදී. .

2. මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණයේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම වේ. මෙම වගකීමට අයත් වනුයේ, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර මනා පාලනය, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වගෙන යාම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන වැරදි සහගත ප්‍රකාශන වලින් තොර බවට වග බලා ගැනීම, සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීම එම වගකීමට අයත් වේ.

3. විගණන විෂය පථය සහ මතය ප්‍රකාශ කිරීමේ පදනම

අපගේ විගණනය පවත්වාගෙන යන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලවය. ඒ අනුව අදාළ මූල්‍ය වාර්තා වැරදි සහගත ප්‍රකාශ වලින් තොර බවට වග බලා සඳහා සහතික වන පරිදි අපගේ විගණනය සැලසුම් කර පවත්වාගෙන යන ලදී. ඉහත සඳහන් මූල්‍ය වාර්තාවල ඇතුළත්, සංඛ්‍යා පැහැදිලි කිරීම් සහ අදාළ කරගත් ගිණුම් ප්‍රතිපත්ති හා අධ්‍යක්ෂවරුන් කර ඇති ඇස්තමේන්තු යනාදිය තහවුරු කර ගැනීම වස් අදාළ සාක්ෂි, පරීක්ෂණ පදනමක් යටතේ භාවිතා කළ අතර, මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අදාළව පිළියෙළ කර ඇත්දැයි යන්න පරීක්ෂා කරන ලදී. විගණන සඳහා අදාළ වේ යයි අප විශ්වාස කළ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබා ගන්නා ලදී. එම නිසා අප විසින් කරන ලද විගණනයන්, ප්‍රකාශිත මතය සඳහා ප්‍රමාණවත් බව අපගේ විශ්වාසයයි.

4. තත්වාගණනය කළ මතය

ආශ්‍රිත සමාගම් වල ආයෝජන රු. 17,875,000.00

සටහන් 1.3.2 සහ 6 විස්තර කර ඇති පරිදි සමාගම විසින් 42% කොටස් ප්‍රාග්ධනයෙහි මුදල් ආයෝජනය කර ඇති අතර එම ආයෝජනය මත ආයෝජනය වන ආයෝජිත සමාගමේ මූල්‍ය හා මෙහෙයුම් තීරණ මත සැලකිය යුතු බලපෑමක් සිදු කිරීමේ අයිතිය ලංකා ලේලන්ඩ් සමාගමට හිමිවේ; සමාගම ආයෝජන පිරිවැයට ඉදිරිපත් කිරීම සහ ලාභාංශ ලැබීම් ආදායම් ප්‍රකාශයේ හඳුනා ගෙන ඇති අතර එම ගිණුම් ගිණුම් තැබීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 27 හි එනම් ආශ්‍රිත සමාගම් වල ආයෝජන ප්‍රමිතියෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා නොමැත. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 27 අනුව ආයෝජන සමාගමේ සිදු කළ කොටස් ප්‍රාග්ධනයට අදාළ කාලඡේදයේ ලාභය/ආදායමක් ලෙස හඳුනාගත යුතු අතර පසුව ලද ලාභය අයෝජනයෙහි ධාරන අගයෙන් අඩු කර පෙන්විය යුතු අතර සමාගම විසින් එහි අවශ්‍යතාවයන් සපුරා නොමැත)හිමිකම් ක්‍රමය යටතේ ආශ්‍රිත සමාගමේ කරන ලද ආයෝජනයේ ධාරණ අගය තක්සේරු කර නොමැති අතර එමගින් ආදායම් ප්‍රකාශයට සිදුවන බලපෑම ද තක්සේරුකර ගිණුම්ගත කර නොමැත.

5. කරුණක් අවධාරණය කිරීම

අපගේ මතය තත්වාගණනය නොකර මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 05 කෙරෙහි අවධානය යොමු කරන අතර ඒ අනුව එහි සඳහන් භූමිය වර්තමානයේ සමාගම භාවිතයේ නැති බවට අප විසින් අවධාරණය කරන්නෙමු.

6. අනෙකුත් නිතිමය සහ නියාමන අවශ්‍යතාවයන් මත වාර්ථාව

අපගේ මතය අනුව මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පණතේ 151(2)වගන්තිය අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

ක්‍රෙස්ටන් එම්.එන්.එස්. සහ සමාගම
වරලත් ගණකාධිකාරී
කොළඹ

1 නොවැම්බර් 2012

සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික)සමාගම
2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශය

| | සටහන් | 31/03/2012 | 31/03/2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| ආදායම | 2 | 46758143/20 | 26,625,720/80 |
| <u>අඩු කලා වියදම්</u> | | | |
| පරිපාලන වියදම් | | (1,663,477/71) | (1,121,613/73) |
| අනෙකුත් වියදම් | | (3,360/00) | (33,125/46) |
| බදු පෙර ලාභය | 3 | 45,091,305/49 | 25,470,981/61 |
| බදු | 4 | (1,185,747/69) | (1,863,000/-) |
| වර්ෂයේ ලාභය | | 43,905,557/80 | 23,607,981/61 |

මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු අංක 08 සිට 16 දක්වා අන්තරගතවේ වරහන් කර ඇති සංඛ්‍යාවලින් පෙන්නුම් කරන්නේ අඩුකිරීමය.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම
2011 මාර්තු 31 දිනට ශේෂපත්‍රය

| | සටහන් | 31/03/2012<br>රු. | 31/03/2011<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 5 | 629,306/00 | 630,722/50 |
| ආශ්‍රිත සමාගම් වල ආයෝජන | 6 | 17,875,000/- | 17,875,000/- |
| | | 18,504,306/00 | 18,505,722/50 |
| **ජංගම වත්කම්** | | | |
| මුල්‍යආයෝජන | 7 | 56,209,632/49 | 51,257,475/41 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 8 | 725,321/64 | |
| බැංකු මුදල් | 9 | 1,341,866/54 | 2,693,419/78 |
| **මුළු වත්කම්** | | 76,781,126/67 | 72,456,689/69 |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 10 | 8,958,600/- | 8,958,600/- |
| පොදු සංචිත | | 9,800,924/- | 9,800,924/- |
| රඳවාගත් ලාභ | | 57,261,530/27 | 52,387,342/48 |
| | | 76,021,054/27 | 71,146,866/48 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 11 | 27,000/- | 27,000/- |
| ගෙවිය යුතු ආදායම් බදු | 12 | 733,072/40 | 1,282,823/21 |
| | | 760,072/40 | 1,309,823/21 |
| **මුළු ස්කන්ධයහා වගකීම්** | | 76,781,126/67 | 72,456,689/69 |

මුල්‍ය ප්‍රකාශනයන්ට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු අංක 08 සිට 16 දක්වා අන්තරගතවේ

ඉහත මුල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව පිළයෙළ කර ඇති බවට මම විසින් සහතික කරමි.

..................................
මුල්‍ය පාලක

මෙම මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීමවන අතර අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් පහත අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් කර අනුමත කරන ලදී.

අධ්‍යක්ෂක 01................................ 2............................................

**සීමාසහිත ලංකා ලේලන්ඩ් සමාගම**
**2012 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා**
**ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. | පොදු සංචිත රු. | රදවාගත් ලාභය රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| 2010/03/31 ට ශේෂය | 8,958,600/- | 9,800,924/- | 49,198,110/87 | 67957634/87 |
| වසරේ ලාභය | | | 23,607,981/61 | 23607981/61 |
| ගෙවූ ලාභාංශ | - | - | (20,418,750/00) | (20,418,750/00) |
| 2011/03/31 ට ශේෂය | 8,958,600/- | 9,800,924/- | 52,387,342/48 | 71,146,866/48 |
| වසරේ ලාභය | - | - | 43,905,557/80 | 439,055,557/80 |
| ගෙවූ ලාභාංශ | - | - | (39,031,370/01) | (39,031,370/01) |
| 2012/03/31 ට ශේෂය | 8,958,600 | 9,800,924 | 57,261,530/27 | 76,021,054/27 |

මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ පිටු අංක 06 සිට 16 දක්වා සටහන් අන්තර්ගතවේ.

මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු අංක 08 සිට 21 දක්වා අන්තරගතවේ.

**සීමාසහිත ලංකා ලේලන්ඩ් පෞද්ගලික සමාගම**

**2012 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන | 31/03/2012 | 31/03/2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය** | | | |
| බදු පෙර ලාභය | | 45,091,305/49 | 25,470,981/61 |
| **ගැළපීම්** | | | |
| ක්ෂය | 5 | 1,416/50 | 1,416/50 |
| පොලී ආදායම | 2 | (5,920,643/20) | (6,206,970/80) |
| ලාභාංශ ආදායම | 2 | (40,837,500/00) | (20.418,750) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය අලාභය** | | ((1,665,421/21) | ((1,153,322/69) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 8 | (65,550/00 | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 11 | (0) | (17.090/20) |
| මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් | | (1,730,971/21) | (1.170.412/89) |
| ආදායම බදු සහ රඳවාගැනීමේ බදු ගෙවීම් | 12 | (1,735,498/50) | (2,362,952/08) |
| පොලී ලැබීම් | | 5,260,871/56 | 6,206,970/80 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | 1,794,401/85 | 2,673,605/83 |
| ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය | | | |
| මූල්‍ය වත්කම්හි ආයෝජනයන්හි ශුද්ධ ඉවත් කර ගැනීම | 7 | (4,952,157/08) | (53.699/13) |
| ලාභාංශ ලැබීම | | 40,837,500/00 | 20,415,750 |
| ආයෝජන ක්‍රියාකාරකම් මගින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | 35,885,342/92 | 20,365,050/87 |
| **මූල්‍ය කුයාකාරකම් මත මුදල් ප්‍රවාහය** | | | |
| ලාභාංශ ගෙවීම් | | (39,031,370/01) | (20.418,750) |
| **මූල්‍ය ක්‍රියාකාරම් සහ ශුද්ධ මුදල් ප්‍රමාණය** | | (39,031,370/01) | (20.418.750) |
| **මුදල් හා මුදල් නොවන දෑහි වෙනස්වීම** | | 1,351,625/24 | 2,619,906/70 |
| **වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | 9 | 2,693,491/78 | 73,585/08 |
| **වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | 9 | 1,341,866/54 | 2,693,419/78 |

**සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික)සමාගම**

**මූල්‍ය ප්‍රකාශන වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය**

**1.1ආයතනික තොරතුරු**

සීමාසහිත ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම 1938 අංක 51 දරණ සමාගම් අඥා පනත යටතේ පිහිටුවා 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත සංස්ථාපනය කර ඇති අංක 80/ 12 රබර්වත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ යන ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති සීමිත පුද්ගලික සමාගමකි.

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ භාණ්ඩාගාර බිල්පත් වල සහ ස්ථාවර තැන්පතු වල මුදල් ආයෝජනය කිරීමයි.

2012 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2012/11/01 වන දින අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

**1.2පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්**

**1.2.1 ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා සමාගම් පනතේ විධිවිධානවලට අනුකූල වීම**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කර ඇති ගිණුම්රකණ ප්‍රමිත වලට සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙළ කොට ඉදිරිපත් කර ඇත.

**1.2.2 මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී යොදාගත් ගිණුම්කරණ මූලධර්ම**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන උපචිත හා ඓතිහාසික පිරිවැය යන සංකල්පයන්ට අනුකූලව ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

**1.2.3 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

**සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික)සමාගම**

**සටහන 1 වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති වල සාරාංශය**

**1.2 පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්**

**1.2.4 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී භාවිතා කළ උපකල්පයන් හා විනිශ්චයන්**

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී සමාගමේ කළමණාකාරිත්වයට විවිධ උපකල්පනයන් හා විනිශ්චයන් කිරීමට සිදුවන අතර එකී විනිශ්චයන්වසර අවසානයේ සමාගමේ ආදායම්, වියදම්, වත්කම්, වගකීම්, හා අනෙකුත් හෙළිදරව් කිරීම් වලට යම් බලපෑමක් කිරීමට ඉඩ ඇත. එම අහිතකර බලපෑම්අවම් කිරීම සඳහා එකී තක්සේරු හා උපකල්පයන් ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් සාධාරණ සාධක පදනම්කර ගෙන විශ්වාසනීය හේතු සාධක ඇතිව සිදු කර ඇත.

එසේ වුවද තක්සේරු සහ විනිශ්චයන් එහි සත්‍ය ප්‍රතිඵල සමග වෙනස් විය හැක.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී යොදාගන්නා ඇසත්මේන්තු හා සංකල්පයන් යාවත්කාලීනව සමාලෝචනය කරන අතර අදාළ සංශෝධනයන් ද සිදු කරනු ලබයි. එම අදාළ සංශෝධනයන්ගේ බලපෑම වර්තමානය මෙන්ම අනාගත කාලපරිච්ඡේදයන් සඳහාද බලපානු ලබන්නේ නම් එකී සංශෝධනයන් අනාගතයටද බලපානු ලබන පරිදි සංශෝධනය කිරීම සමාගමේ ප්‍රතිපත්තියයි.

**1.2.5 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සංගතභාවය**

සමාගම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දි පෙර වර්ෂ වල භාවිතා කල ගිණුම්ප්‍රතිපත්ති වෙනස් කිරීමකින් තොරව ඒ ආකාරයෙන්ම යොදා ගෙන ඇත.

**1.2.6 සංසන්දනාත්මක තොරතුරු**

මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පහසුවෙන් සැසදීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී, පෙර වර්ෂයේ තොරතුරු නැවත සකස් කර මෙම වර්ෂයට අනුරූපව ඉදිරිපත් කර ඇත,

**1.2.7 ශේෂ පත්‍රදිනට පසු සිදු වීම්**

ශේෂ පත්‍ර දිනෙන් පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් සලකා බලමින් අදාල ගැලපීම් සිදු කරමින් හෝ ගිණුම්කරණ සටහන් වල හෙලිදරව් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.

1.2.8 සමාගම අඛණ්ඩව පවත්වා ගෙන යාමට සමාගමට ඇති හැකියාව අධ්‍යක්ෂකවරු විසින් තක්සේරු කර ඇති අතර නුදුරු අනාගතයේදී සමාගම ඈවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහසක් නොමැති බව උපකල්පනය කරමින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.

**1.2.9 බදු**

**ආදායම් බදු**

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත හා ඉන්පසු එම පනතට සිදු කරන ලද ගැලපීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ආදායම් හා වියදම් උපයෝගී කරමින් ආදායම් බදු ගණනය කර වෙන් කිරීම් සිදු කර ඇත.

**සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික)සමාගම**
**මූල්‍ය ප්‍රකාශන වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය**

**1.3 වත්කම් අගය කිරීම සහතක්සේරු කිරීමේ පදනම්**

**1.3.1 දේපළ පිරියත හා උපකරණ**

**පිරිවැය**

දේපළ පිරියත හා උපකරණසඳහා දැරූ පිරිවැයෙන් ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණයන් අඩු කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත.

දේපළ පිරියත හා උපකරණ වල ධාරණ අගය නැවත අයකර ගත නොහැකි සිද්ධියකදී, හෝ එසේ වීමට සිදුවියහැකි හෝ වෙනස්වන හේතු සාධක පෙන්නුම් කරන අවස්ථාවකදී හානිකරණ අලාභයන් හඳුනාගැනීම සඳහා එම දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය නැවත සමාලෝචනය කිරීම සමාගමේ ප්‍රතිපත්තියය.

වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට වර්තමාන අගයෙහි යම් වැඩි වීමක් ඇති වුවහොත් එය සෘජුවම සංචිත ගිණුමකට බැර කරන අතර එකී වත්කම් පෙර වර්ෂ වල ප්‍රත්‍යාගණනයේදී සිදුවූ ප්‍රත්‍යාගණන අලාභය ආදායම ප්‍රකාශය මත හඳුනාගෙන ඇත්නම් නැවත ප්‍රත්‍යාගණනයේ දී අගය වැඩි වුවහොත් එම වැඩි වූ අගය පෙර අගය අඩුවීම හා සන්සන්දනය කර එම අගය ආදායම් ප්‍රකාශයට ගැලපීම් කල යුතුය.

ඕනෑම ප්‍රත්‍යාගණනයකදී පැන නගින ලද ප්‍රත්‍යාගණන අලාභය, එම වත්කම් වලට අදාළව පෙර පැවති ප්‍රත්‍යාගණන සංචිතයට එරෙහිව කපාහැර අතිරික්ත අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කළ යුතුය.

ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් විකිණීමේ දී එම වත්කමට සම්බන්ධ ප්‍රත්‍යාගණන සංචිතය රඳවා ගත් ලාභයට මාරු කළ යුතුය.

ප්‍රත්‍යාගණනය කරන දිනට සමුච්චිත ක්ෂය වත්කමේ දළ ධාරණ අගයට එරෙහිව ලියහල යුතු අතර, ශුද්ධ ධාරණ අගය ප්‍රත්‍යාගණිත අගයට ප්‍රතිෂ්ඨාපනය කළ යුතය. ප්‍රත්‍යාගණිත කරන ලද දේපළ, පිරියත හා උපකරණ වල, අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ නොලැබෙන විට හෝ වත්කම් විකිණීමේ දී, අදාළ වත්කම්, දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනා නොගත යුතු අතර එම අවස්ථාවේ දී, අදාළ ලාභ හා අලාභ එම වසරට අදාළ ලාභලාභ ගිණුමේ හඳුනාගත යුතුය.

**ක්ෂය වීම**

සින්නක්කර ඉඩම් හැර අනෙකුත් දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ඒවායේ ඵලදායී ජීව කාලය තුළ ක්ෂය කරනු ලබයි.
වත්කම් වල ජීව කාලය පහත පරිදි ඇස්තමේන්තු කර ඇත.

| වත්කම් | වර්ෂය |
|---|---|
| කාර්යාල උපකරණ | 4 |

දේපල, පිරියත හා උපකරණ ඒවායේ භාවිතය පටන් ගත් දිනයේ සිට භාවිතයෙන් ඉවත්කරන හෝ විකුණනු ලබන මාසය තෙක් ක්ෂය කිරීම සමාගමේ ප්‍රතිපත්තිය යි.

සෑම ගිණුම් වර්ෂයක් අවසානයේදීම ඵලදායි ජීවිත කාලය සහ සුන්බුන් අගය නැවත පරීක්ෂාකර අවශ්‍ය නම් ගැළපීම් සිදු කරයි.

පළමු හඳුනා ගැනීමෙන් පසුව සිදුකරන ලබන ප්‍රමාණාත්මක පිරිවැයන් හඳුනාගැනීමේ නිර්නායක ඵලදායි ලෙස සපුරාලන්නේ නම් පමණක් එම පිරිවැයන් වත්කමට ප්‍රාග්ධනිත කිරීම සිදු කරනු ලබයි.

**සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික)සමාගම**
**මූල්‍ය ප්‍රකාශන වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය**

සටහන 1 වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති වල සාරාංශය

**1.3 වත්කම් අගය කිරිම සහ තක්සේරු කිරිමේ පදනම්**
**1.3.2 ආයෝජන**

**ආශ්‍රිත සමාගම් වල කරන ලද ආයෝජන**

ආශ්‍රිත සමාගම් වල කර ඇති ආයෝජන මූලික පිරිවැයෙන් ආශ්‍රිත සමාගම දරා ඇති හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු ගිණුම්ගත කර ඇත. අයෝජනයෙන් ලද හෝ ලැබිය යුතු ආදායම් ලෙස ලද ලාභාංශ පමණක් හඳුනාගෙන ඇත.

**1.3.3 වත්කම්වල හානිකරණය**

සමාගම විසින් සෑම ගිණුම්කරණ වර්ෂයකට වරක් වත්කම් හානිකරණය වී ඇති බවට කිසියම් හෝ පෙන්නුම් කිරිමක් සමාගමේ සිදු වී ඇත්දැයි තක්සේරු කළ යුතුය. එවැනි හානිකරණ ලක්ෂණයන් පෙන්නුම් කරන විටදී හෝ සමාගම විසින් තීරණය කරන ලද වෙනත් අවස්ථාවකදී සමාගම විසින් තම දේපල, පිරියත හා උපකරණ වල නැවත අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කළ යුතුය. මෙහිදී වත්කම් වලින් ජනිත වන මුදල් ප්‍රවාහය වෙන වෙනම හඳුනා ගත නොහැකි නම් සමාගම විසින් එම වත්කම් අන්තර්ගත වන සමස්ථ ඒකකයම සලකා බලා වත්කමේ නැවත අයකර ගත හැකි අගය තීරණය කළ යුතු අතර, නැවත අයකරගත හැකි අගය ලෙස අදාළ වත්කමේ අනාගත භාවිතයෙන් ජනිත වන මුදල් ප්‍රවාහය වට්ටම් කර ලැබෙන අගය හා අදාළ වත්කමේ සාධාරණ අගය යන දෙකින් වැඩි අගය ගත යුතුය. එසේ ගණනය කරන ලද නැවත අයකර ගත හැකි අගය වත්කමේ ධාරණ අගය හා සැසඳිය යුතු අතර එම සැසඳීමේ දී ධාරණ අගය වත්කමේ නැවත අයකර ගත හැකි අගයට වඩා වැඩි නම් එම වැඩි ප්‍රමාණය හානිකරණ අලාභය ලෙස සලකා කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයට ලියාහල යුතුය.

හානිකරණයට ලක් වූ යම් වත්කමක නැවත අයකර ගත හැකි අගය සාධාරණව වැඩි වී ඇතැයි තක්සේරු කළ හැකි අවස්ථාවක දී පෙර වර්ෂයේ ලාභයට එරෙහිව කපාහල හානිකරණ ආලභයට සමාන ප්‍රමාණයක් අදාළ කාලපරිච්ඡේදයේ ආදායමට මාරු කළ යුතුය.

**1.3.4 බිල්පත් / භාණ්ඩාගාර බැඳුම්කර**

කෙටි කාලීන මූල්‍ය උච්චාවචනයන්ගෙන් ලාභ ලබා ගැනීමේ අරමුණෙන් භාණ්ඩාගාර බිල්පත්වල හා වෙනත් සුරකුම්පත්වල ආයෝජනය කර ඇති අතර ඒවායේ පිරිවැය හා අදාල අධිමිල හෝ අවමිල සැලකිල්ලට ගෙන ගිණුම්ගත කර ඇත.

**සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම**
**මූල්‍ය ප්‍රකාශන වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය**

1.3.5 වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ඒවායේ උපලබ්ධි වන අගයට තක්සේරු කර ගිණුම් ගත කර ඇත.

1.3.6 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු හා ඉහළ ද්‍රවශීලතාවයක් සහිත අඩු පිරිවැයක් යටතේ මුදල් බවට පත් කළ හැකි කෙටි කාලීන ආයෝජනයනගේ හුවමාරු අගයන්,මුදල් හා මුදල් සමාන දෑ ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා අතැති මුදල්, බැංකු මුදල් හා ආසන්න මුදල් වල එකතුවෙන් බැංකු අයිරා අගය අඩු කර පෙන්වා ඇත.

සමාගම ලද ලාභාංශ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති අතර ලාභාංශ ගෙවීම් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත.වක්‍ර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පොළී ලැබීම් මෙහෙයුම් මුදල් ප්‍රභවයක් වශයෙන් ඉදිරිපත් කර ඇත

1.4 වගකීම් සහ වෙන් කිරීම්
1.4.1 සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වය

අදාල ආඥා පනත් හා නීතීන්ට අනුව සියළුම සේවකයෝ සේවක විසින් අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල් දායකය ලැබීම සඳහා සුදුසුකම් ලබයි. සමාගම සේවකයන්ගේ දළ වැටුපෙන් 12% ක් සේවක අර්ථ සාධක අරමුදලටද දළ වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට ද දායකත්වය සපයයි.

1.4.2 අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන්කිරීම්

ශේෂපත්‍ර දිනට පවතින, අනාගතයේ දී නිරවුල් කිරීමේදී ආයතනයේ සම්පත් පිටතට ගලා යනු ඇතැයි විශ්වාසදායී ලෙස ඇස්තමේන්තු කළ හැකි සියළුම බැඳීම් සඳහා වෙන් කිරීම් සිදු කර ඇත. අනාගතයේදී නිරවුල් කිරීමේ දී ආයතනයේ සම්පත් පිටතට ඇදී යන, අතීත ක්‍රියාවන් මත පදනම් වූ, එහෙත් අනාගතයේ සම්පත් වල ගලා යෑම අනාගත සිද්ධියක් හෝ සිද්ධීන් කිහිපයක් මත පදනම් වන ආයතනයේ සම්පූර්ණ පාලනයෙන් තොර වූ සියළුම අසම්භාව්‍ය බැරකම් ගිණුම්කරණ සටහන් වල හෙළිදරව් කර ඇත.

එසේම අනාගතයේදී සමාගමට ආර්ථික ප්‍රතිලාභ ජනිත කරනු ලබන අසම්භාව්‍ය වත්කම් ද මූල්‍ය ප්‍රකාශන සටහන් වල හෙළිදරව් කර ඇත.

1.4.3 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායේ පිරිවැයට වාර්තා කර ඇත.

1.4.4 ප්‍රාග්ධනබැඳීම්

සමාගමේ ප්‍රාග්ධන බැඳීම් මූල්‍ය ප්‍රකාශන වල නියමිත සටහන් තුළින් හෙළිදරව් කර ඇත.

**1.5 ආදායම් ප්‍රකාශය**

**1.5.1 ආදායම් හඳුනා ගැනීම**

සමාගම තුළට ආර්ථික ප්‍රතිලාභ ජනිත කරන ප්‍රමාණය හා අදාළ ආදායම ජනිත කිරීමේ දී වැය වූ පිරිවැයෙහි ප්‍රමාණය සැලකිල්ලට ගෙන ආදායම් හඳුනා ගැනීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. එහිදී අදාළ ආදායම ලැබුණු හෝ ලැබිය යුතු එනම්, උපචිත සංකල්පය යටතේ හඳුනා ගන්නා අතර අගය එකතු කළ බදු ආදායමෙන් ඉවත් කරනු ලබයි.

**පහත විශේෂිත මිනුම් ආදායම හඳුනා ගැනීමේ දී සමාගම භාවිතා කර ඇත.**

**පොළී ආදායම**

පොළී ආදායම මුදල් පදනමින් හඳුනා ගෙන ඇත.

**ලාභාංශ**

ලාභාංශ ආදායම හඳුනාගෙන ඇත්තේ කොටස්හිමියන්ට ලාභාංශ ආදයම ලැබීමට අදාළ හිමිකම ලැබූ පසුවය.

**පොළී ආදායම මත බදු බැර**

භාණ්ඩාගාර බැදුම්කර සහ බිල්පත් සඳහා ලද ශුද්ධ පොළියට අදාළ 10% බදු බැර එකතු කොට දළ පොළී ආදායම ලෙස ගිණුම්ගත කර ඇත. එහිදී බදු බැර ශුද්ධ ආදායමෙන් 1/9 කි.

**වෙනත් ලාභ සහ පාඩු**

දේපල, පිරියත, උපකරණ, ආයෝජන හා වෙනත් ජංගම නොව වත්කම් වල විකුණුම් ප්‍රතිෂ්ඨාවෙන් අදාළ වත්කමේ ධාරණ අගය හා අනෙකුත් විකිණීමේ වියදම් අඩු කිරීමෙන් පසු ලද ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනීම සමාගමේ ප්‍රතිපත්තියයි.

සමාගමේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු වලින් පරිභාහිර එක හා සමාන ඇති අනෙකුත් ඒකක සමඟ ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ප්‍රමාණාත්මක නොවන ලාභ හා අලාභ එකිනෙකට හිලව් කර ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා ඇත.

**වෙනත් ආදායම්**
වෙනත් ආදායම් උපචිත පදනමට හඳුනා ගෙන ඇත.
1.5.2 **වියදම්**

දරන ලද පිරිවැය හා එම පිරිවැයෙන් ජනිත වූ ආදායම අතර ඇති සෘජු සම්බන්ධය සැලකිල්ලට ගෙන වියදම් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

වර්ෂයේ සියළුම වියදම්,ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සඳහා සහ දේපල පිරියත උපකරණ වල ඵලදායීතාවය පවත්වා ගැනීම සඳහා දරා ඇත. සමාගමේ කාර්යඵල මනා ලෙස ඉදිරිපත් කිරීමේ දී, වියදම් දරා ඇති කාර්ය සැලකිල්ලට ගෙන වර්ෂයේ ආදායම් ප්‍රකාශය පිළියෙළ කර ඇත.

1..6 නව ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ බලපෑම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් 2012 ජනවාරි මස පළවෙනිදා සිට ක්‍රියාත්මක වන පරිදි නව ගිණුම්කරණ ප්‍රමිති රාශියක් ඉදිරිපත් කර ඇත මෙම නව ප්‍රමිතීන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිතීන්ගෙන් හා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ගෙන් සමන්විත වන අතර එම ප්‍රමිතීන් 1/4/2012 සිට බලාත්මක වන බැවින් මෙම වසරේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී උපයෝගි කරගෙන නොමැත. එසේ වුවද සමාගම් එම නව ප්‍රමිතීන්ගෙන් මූල්‍ය ප්‍රකාශනයන්ට සිදුවන බලපෑම අගයා ඇති නමුත් එම බලපෑම ශේෂපත්‍ර දින වන විටත් ප්‍රමාණාත්මකව ගණනය කර හෙළිදරව් කර නොමැත.

**සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික)සමාගම**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

සටහන 2

| | 31/03/2012 | 31/03/2011 |
|---|---|---|
| | රු. | රු. |
| ආදායම | | |
| ලාභාංශය ආදායම | 40,837,500/00 | 20,418,750/00 |
| පොළී ආදායම | 5,920,643/20 | 6,206,970/80 |
| | 46,758,143/20 | 26,625,720/80 |

සටහන 3

බදු පෙර ලාභය

බදු පෙර ලාභය ගණනයේදී පහත වියදම් ද අඩු කර ඇත.

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂක දීමනා | 222,000/00 | 431,000 |
| අධ්‍යක්ෂක ගාස්තු | 321,040/00 | 124,100 |
| විගණන ගාස්තු | 27,000/00 | 27,000 |
| ඌන වෙන් කිරීම -2010/2011 | 3,845/00 | |
| සේවක පිරිවැය | 204,000/00 | 168,000 |
| සේවා අර්ථ සාධක හා භාරකාර දායකය | 124,350/00 | 89,850 |

සටහන 4

ආදායම් බදු

4.1 2006 අංක 10 දරණ දේශිය ආදායම් පනතේ සඳහන් පරිදි සමාගම විසින් බදු අය වන ආදායමෙන් 28% ආදායම් බදු ලෙස වෙන් කොට ගෙවිය යුතුය.

| | | |
|---|---|---|
| කාලඡේදය සඳහා ආදායම් බදු | 1,226,462/00 | 1,863,000 |
| ආදායම් බදු අධි වෙන් කිරීම - පෙර වර්ෂය | (40,714/31) | |
| | 1,185,747/69 | 1,863,000 |

### 4.2 බදු වියදම සහ ගිණුම්කරණ ආදායම සැසඳීම

| | | |
|---|---|---|
| ආදායම් බදු සඳහා ගිණුම්කරණ ලාභය | 45,091,305 | 25,470,982 |
| අයවන ලාභය සඳහා බදු බලපෑම | 12,625,565 | 9,048,566 |
| බැහැර කර දැමූ ලාභය සඳහා බදු බලපෑම | (11,434,500) | (7,253,761) |
| අඩු කළ නොහැකි වියදම් සඳහා බදු බලපෑම | 35,397 | 68,001 |
| ආදායම් බදු අධි ප්‍රතිපාදනය - | | 194 |
| - පෙර වර්ෂය | (40,714) | 0 |
| ආදායම් ප්‍රකාශයේ සඳහන් වන බදු සඳහා වන වියදම | 1,185,748 | 1,863,000 |

**සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික)සමාගම**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**සටහන 05 :-දේපල පිරියත හා උපකරණ**

| | 01/04/2011 | 2012 මාර්තු 31 |
|---|---|---|
| | රු. | රු. |
| **පිරිවැය** | | |
| සින්නක්කර ඉඩම් | 626,473 | 626,473 |
| කාර්යාල උපකරණ | 5,666 | 5,666 |
| | 632,139 | 632.139 |

| | 01/04/2011 | වර්ෂය තුළ ක්ෂය වීම | 2012 මාර්තු 31 |
|---|---|---|---|
| **ක්ෂය** | | | |
| සින්නක්කර ඉඩම් | | | |
| කාර්යාල උපකරණ | 1,416/50 | 1,416/50 | 2,833/00 |
| | 1,416/50 | 1,416/50 | 2,833/00 |

| | 31/03/2011 | 2012 මාර්තු 31 |
|---|---|---|
| **ලියාභල අගය** | | |
| සින්නක්කර ඉඩම් | 626,473 | 626.473 |
| කාර්යාල උපකරණ | 4249/50 | 2833/00 |
| | 630,722/50 | 629306/00 |

වර්තමානයේ මෙම භූමිය සමාගම භාවිතයේ නොමැත.

**සටහන් අංක 6**
ආශ්‍රිත සමාගමේ කර ඇති ආයෝජන

| | % අයිතිය | | 31/03/2012 | | | 31/03/2011 | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | කොටස් සංඛ්‍යාව | පිරිවැය රු. | වෙළඳපළ වටිනාකම රු. | කොටස් | පිරිවැය සංඛ්‍යාව | වෙළඳපළ වටිනාකම රු. |
| කොටස් වෙළඳපොලේ දී සදහන් නොකෙරුනු පිරිවැය | | 42% | 1,512,500 | 17,875,000 | 3,130,422,250 | 1,512,500 | 17,875,000 | 2,798,427,500 |
| සීමාසහිත ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම | 42% | | | 17,875,000 | 3,130,422,250 | | 17,875,000 | 2,798,427,500 |

මෙහිදී කොටස් යනු, සාමාන්‍ය කොටස්වේ.

සීමාසහිත ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (CONTD)

| | 31/03/2012 | 31/03/2011 |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන 7 - මූල්‍ය වත්කම්** | | |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 32,500,000/- | 27,500,000/- |
| - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 21,150,000/- | 21,150,000/- |
| භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව | 2,559,632/49 | 2,607,475/41 |
| | 56,209,632/49 | 51,257,475/41 |
| **සටහන 8 - වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව - ලැබිය යුතු | 65,550/00 | - |
| ලැබිය යුතු පොලී | 659,771/64 | - |
| | 725,321/64 | |
| **සටහන 9 - මුදල් හා මුදල් සමාන දෑ** | | |
| බැංකු මුදල් | 1,341,866/54 | 2,693,491/78 |
| | 1,341,866/54 | 2,693,419/98 |

**සටහන් 10 - ප්‍රකාශිත ප්‍රාග්ධනය**

| | 31/03/2012 | 31/03/2011 |
|---|---|---|
| සාමාගම නිකුත් කළ සහ ගෙවානිම් කොටස් ප්‍රමාණය | 2,150,000 | 2,150,000 |
| මාර්තු 31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය | 15,750,000/- | 15,750,000/- |
| අඩු කලා හිඟ හිටි ඇරයුම් | (6,719,400/-) | (6,791,400/-) |
| | 8,958,600/- | 8,958,600/- |

සමාගමට මුදලින් ලැබුණු හෝ නොලැබුණු එහෙත් ඇරයුම් කළ කොටස් වල වටිනාකම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස ගිණුම්ගත කර ඇත.

සමාගමේ සාමාන්‍ය කොටස්හිමියන්ට කලින් කලට අනුමත කරන පරිදි ලාභාංශ ලැබීමට හිමිකම් ලැබෙන අතර එක් කොටසකට එක් ඡන්දය මගින් වාර්ෂික මහ සභා රැස්වීමේ දී ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම හිමිවේ.

**සටහන් 11 වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ**

| | 31/03/2012 | 31/03/2011 |
|---|---|---|
| උපචිත වියදම් | 27,000/- | 27,000/- |
| | 27,000/- | 27,000/- |

**සටහන 12- ආදායම් බදු වගකීම්**

| | 31/03/2012 | 31/03/2011 |
|---|---|---|
| අප්‍රේල් 01 දිනට ශේෂය | 1,282,823/21 | 1,782,755/29 |
| වර්ෂය සඳහා වෙන්කිරීම - | 1,226,462/00 | 1,863,000/- |
| පෙර වර්ෂයේ අඩු වෙන් කිරීම | (40,714/31) | |
| | 2,468,570/90 | 3,645,775/29 |
| වර්ෂය තුළ ගෙවීම් | (1,742,255/-) | (1,742,255/-) |
| කල්පිත බදු බැර | (24,288/77) | (26,247/08) |
| රඳවාගැනීමේ බදු | (469,100/83) | (594,450) |
| 31/03/2012 දිනට ශේෂය | 733,072/40 | 1,282,823/21 |

**සටහන 12 අසම්භාව්‍යවගකීම්**

මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපීමට හෝ සටහන් මඟින් ඉදිරිපත් කිරීමට අසම්භාව්‍ය බැරකම් අදාළ කාලච්ඡේදයේ දී නොමැත.

**සටහන් 13**

2012/03/31 දිනට ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැරකම් නොමැත.

**සටහන් 14 ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවීම්**

2012/03/31 දිනට ගැලපීම සඳහා හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම සඳහා ශේෂපත්‍ර දිනට පසුව ඇති වූ ප්‍රමාණාත්මක සිදුවීම් නොමැත .

**සටහන් 15 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු**

**ඉහළ කළමනාකරණ පුද්ගලයන් සමග ගනුදෙනු**

කළමනාකරණ පුදගලයින් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අන්තර්ගත වේ.

**15.1 ඉහළ කළමනාකරණ බැඳීම්**

| | 31/03/2012 | 31/03/2011 |
|---|---|---|
| | රු. | රු. |
| කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 543,040/00 | 555,100/- |

**15.2 ඉහළ කළමනාකරුවන්ගේ සමීප පවුල් සාමාජිකයන් සමග වූ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු**

ඉහළ කළමනාකරුවන් හා ඔවුන්ගේ සමීප පවුල් සාමාජිකයන් සමග හවුලේ සිදු වූ ගනුදෙනු වර්ෂය අතර තුර සිදු කර නොමැත.